# ඉස්කෝලේ කාලේ හා රාජාලි පියාපත්







ජගත් ජේ. එදිරිසිංහ යනු කවරෙකුදැයි ඕස්ට්‍රේලියාවේ පමණක් නොව ශ්‍රී ලංකාවේ සාහිත්‍යකාමීන්ට අමුතුවෙන් හඳුන්වා දිය යුතු නොවේ. මා පළමුවෙන්ම ජගත් හඳුනාගත්තේ මීට වසර දහයකට පමණ පෙර මෙල්බර්න් නුවර පළකිරීමට පටන් ගත් -සෙරන්ඩිබ් (SERENDIB) පුවත් පතේ සිංහල පිටුව ජගත් විසින් සංස්කරණය කරනු ලබන්නට පටන් ගත් දිනවලදීය. අනතුරුව 'පහන' පුවත් පතේ ආරම්භක සම කර්තෘවරයෙකු ලෙසත් 'සන්නස' පුවත් පතේ ආරම්භකයා ලෙසත් ජගත් ජේ. එදිරිසිංහ නම්වූ පුවත් පත් කලාවේදියාත්, සංවේදී කවියාත්, නවකථාකරුවාත් හඳුනාගන්නට මට අවස්ථාව උදාවිය. ජගත්ගේ කවි, තීරු ලිපි හා නවකතා කියවීමෙන් ජගත් තුළ ඇති නිර්මාණාත්මක කුසලතාව හඳුනාගන්නට මට හැකිවිය.

ජගත් ජේ. එදිරිසිංහ නම්වූ සොඳුරු කලාකරු-වාගේ සංවේදී හදවත ගැඹුරින් අවබෝධ කර ගන්නට මට තවත් අවස්ථාවක් උදාවූයේ ඔහුගේ අළුත්ම පොත් දෙක කියවීමත් සමගය. ජගත් ගේ 'ඉස්කෝලේ කාලේ' නැමැති යොවුන් නවකතාවත් 'රාජාලි පියාපත' නමැති කාව්‍ය සංග්‍රහයත් කියවීමෙන් මා තුළ ඇතිවූ කලාත්මක කම්පනයත් නිර්මාණාත්මක

*'ඉස්කෝලේ කාලේ' කියවීමෙන් මගේ ළමා වියට මනසින් පිවිසුණු මම පොත කියවා හමාර කළ විට ඇති වූ කම්පනයෙන් බොහෝ වේලා ගත කළෙමි. 'අවසාන තරංගය' නැමැති අවසන් පරිච්ඡේදය කියවා හමාර කරන සංවේදී පාඨකයා ගේ දෑසට කඳුලක් නැඟීම නොවැළැක්විය හැකිය.*

ප්‍රහර්ෂයත් විසින්ය මේ සටහන ලියන්නට මා පොළඹවනු ලැබුවේ.

ජගත් ගේ 'රාජාලි පියාපත' විවිධ තේමාවන් යටතේ විවිධ විරිතින් ලියවුණු විසිතුරු කවි එකතුවකි. අව්‍යාජ කලාකරුවකු ලෙස ජගත් ගේ සංවේදී බවත්, දඩබ්බරකමත්, මානව දයාවත් පෙන්වන කවි මෙන්ම දාර්ශණික සිතිවිලි රැගත් කවි සංකල්පනා ද 'රාජාලි පියාපත' තුලින් මතුවෙයි. නිවී සැනසිල්ලේ මෙම කවිපොත කියවන සහෘදයකු ජීවිතයේ විවිධ අවස්ථාවලදී තමා ලත් අත්දැකීම් දෙස වෙනත් දෘෂ්ඨි කෝණයකින් බලන්නට පෙළඹෙනු ඇත.

කවියේ අතාවශ්‍ය අංගයක් වන සංක්ෂිප්ත බව දාර්ශනික සිතිවිල්ලක් ධ්වනිත වන ආකාරයට කදිම ආකෘතියකින් ඉදිරිපත් කිරීමට ජගත් සතු හැකියාව පෙන්වන කවියකි 'එකමුතු'

වැහි වතුර
තුරු පතග
එකමුතුව............
වෙන් වන්න
මොහොතකට
පෙරාතුව............ (පිට 64)

කවියෙකුගේ හදවත හා බාහිර ලෝකය අතර ඇති වෙනස ජගත් මෙසේ දක්වයි.

නුඹේ හදවත
හරිම උණුසුමයි
මගේ සිත තුළ
එනමුදු
මෙල්බනය
සීතලයි
වෙනදා වගේම........... (පිට 44)

ජගත් ඉතා සංයමයෙන් බස වහරන කවියෙකි. එය කවියෙකු සතු උත්කෘෂ්ඨ ගුණාංගයකි. බසේ ව්‍යංගාර්ථ ඉස්මතු වන අයුරින් ඉදිරිපත් කරන විවිධ තේමා ගත් කවි ඊට අනුරූප විරිතකින් සැරසීමට ජගත් ගත් ප්‍රයත්නය සෑම කවියකදීම සාර්ථක වී ඇති බව මගේ හැඟීමයි. 'මගේ ප්‍රේමය' නැමැති කවි පෙළේ එක් කවියක් නිදසුන් කොට දක්වමි.

තරු කැට විසුල අහසක
දළ රළ සැලෙන මුහුදක
රළු ගල් බොරළු පොළවක
සඟවා තබනු කෙලෙසක

ජගත් ගේ 'රාජාලි පියාපත' පාඨක විචාරක සහෘද සැමගේ අවධානයට ලක්විය යුතු කවි එකතුවකි.

ජගත් ගේ යොවුන් නවකථාව වන 'ඉස්කෝලේ කාලේ' අප සියළු දෙනාම අපගේ පාසල් විය කරා ගෙන යන අගනා වෘතාන්තයකි. ඒ පොත කියවීමෙන් ළමා කල මාර්ටින් වික්‍රමසිංහගේ 'මඩොල් දූව' කියවීමෙන් ලත් සතුට වැනි සතුටක් ලැබුවෙමි. ඉතා සිත්ගන්නා වියත් බස් වහරකින් ලියවී ඇති 'ඉස්කෝලේ කාලේ' බස් වහර බෙහෙවින් සරළය. ඉතාමත්ම අසීරූ කාර්යය නම් සරලව ලිවීම යයි වරරක් ටෝලිස්ටෙරයි කීවේය.

'ඉස්කෝලේ කාලේ' කියවීමෙන් මගේ ළමා වියට මනසින් පිවිසුණු මම පොත කියවා හමාර කළ විට ඇති වූ කම්පනයෙන් බොහෝ වේලා ගත කළෙමි. පොතේ මුල් පරිච්ඡේද කිහිපයෙන් ජගත් පාඨකයා රැගෙන යන්නේ පාසල් වියේ දරුවෙකු මුහුණ දෙන සුන්දර අත්දැකීම් මාලාවකටය. 'හොල්මන් බංගලාව' නැමැති පරිච්ඡේදය පාඨකයා ත්‍රාසයෙන් අලලා සදය සිනහවෙන් අවසන් වෙයි. 'වෙසක් කූඩු රාජයා' කියවා හමාර කරන රසිකයා පොත පසෙකින් තබන්නේ සිනහව නවත්වා ගත නොහැකිවීමෙනි. 'අවසාන තරංගය' නැමැති අවසන් පරිච්ඡේදය කියවා හමාර කරන සංවේදී පාඨකයා ගේ දෑසට කඳුලක් නැඟීම නොවැළැක්විය හැකිය.

ගොඩගේ මිතුරු පොතක් ලෙස නිකුත් වී ඇති 'ඉස්කෝලේ කාලේ' ශ්‍රී ලාංකාවේ අධ්‍යාපන අමාත්‍යංශය මගින් පාසල් අතිරේක කියවීම් පොතක් ලෙස නිර්දේශ කළ යුතුය.

ආචාර්ය පාලිත ගණේවත්ත

We listen to you like a friend...
We advise you like a father...
Your negligence is our pain....

..Please

do not
Drink &
Drive..

This campaign
against irresponsible drinking
is sponsored by

FAIRFIELDS IMMIGRATION LAWYERS
Melbourne.